**බුද්ධශාසන අරමුදල - 2018**

බුද්ධශාසන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මගින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවද, 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන්වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු 2016, 2017 හා 2018 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**2. විගණන නිරීක්ෂණ**

**(අ) නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ රෙගුලාසි 396 | 2013 ඔක්තෝබර් 01 දින සිට 2017 සැප්තැම්බර් 21 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී අරමුදල විසින් නිකුත් කරන ලද එකතුව රු.56,864 ක් වූ චෙක්පත් 7 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අරමුදලේ පාලක මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමින් පවතී | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |
| (ආ) 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල් පනතේ 8(ආ) වගන්තිය | ආයෝජනවලින් ලැබෙන සියලු ආදායම් ශ්‍රී ලංකා මහ බැංකුවේ විවෘත කර ඇති ජංගම ගිණුමට බැරකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී | අරමුදල් පනතේ 7 (ඊ) හා 14 වැනි වගන්ති යටතේ පනවා ඇති රීති ප්‍රකාරව පාලක මණ්ඩලය විසින් ගනු | පනතෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලද රු.28,798,412 ක් වූ පොළී ආදායම් නැවත ආයෝජනය කර තිබුණි. | ලබන තීරණ පරිදි සුදුසු ආයෝජනය කිරීම් හා ගිණුම් අවසන් කිරීමේ තීරණ ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව අරමුදලේ ආදායම් වැඩි වන පරිදි අදාල ආයෝජන සිදුකර ඇත. |

**(ආ) ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අතිදුෂ්කර විහාරස්ථාන 10 ක සංඝාවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 10 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද කිසිඳු විහාරස්ථානයක සංඝාවාස ඉදිකර නොතිබුණි. එහෙත් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන පරිගණකගත තොරතුරු පද්ධතිය අනුව 2020 පෙබරවාරි 10 දිනට ආවාස ගෘහ නොමැති හෝ අසම්පූර්ණ විහාරස්ථාන 77 ක් නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය පාලක මණ්ඩලයේ උපදෙස් පරිදි අවලංගු කිරීමට සිදුවී ඇත. | ආවාස ගෘහ නොමැති හෝ අසම්පූර්ණ විහාරස්ථාන සම්පූර්ණකර ගැනීමේ අවශ්‍යතාවය ඉටු කළ යුතු වීම |

**(ඇ) කළමණාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i.) දිස්ත්‍රික්කයකට එක් ආයතනයක් බැගින් වීන භාෂා හා සංස්කෘතික අධ්‍යයන ආයතන පිහිටුවීමේ ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිමඩුව ශ්‍රී වර්ධනාරාම විහාරස්ථානයේ අධ්‍යයන ආයතනයක් පිහිටුවා තිබුණි. එම ආයතනයෙන් ශිෂ්‍ය හිමිවරුන් 30කට මූලික හා ඩිප්ලෝමා ලෙස මාස 6 බැගින් වූ පාඨමාලා දෙකක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර රු.210,000 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද, ශිෂ්‍ය හිමිවරුන් 05 දෙනෙකුට මූලික පාඨමාලාව අවසන් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.257,975 ක් වැයකර තිබුණි. එම ශිෂ්‍ය හිමිවරුන් 2020 මාර්තු වන විටත් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා සම්බන්ධවී | වැඩසටහන අසාර්ථක වැඩසටහනක් බවට ප්‍රත්‍යක්ෂ වූ අතර ස්වාමීන් වහන්සේලා වැඩි කර ගැනීමට උපදෙස් ලබා දෙන ලදී. නමුත් එය සාර්ථක කර ගැනීමට අපොහොසත් වූ බැවින් මූලික පාඨමාලාවෙන් අවසන් කල අතර ඉන්පසු වඩාත් සාර්ථක ලෙස උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් පැළියගොඩ විද්‍යාලංකාර පිරිවෙනේ ආරම්භ කරන ලදී. එම පාඨමාලාව සඳහා ඉහත මූලික පාඨමාලාව සාර්ථක ලෙස අවසන් කළ සිසුන් | විධිමත් පරිදි සැලසුම් සකස් කර ව්‍යාපෘති ආරම්භ කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| නොතිබුණු බැවින් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. | අනුයුක්ත කරන ලද අතර දැනට චින භාෂා හා සංස්කෘතික අධ්‍යයන උසස් ඩිප්ලෝමා පාඨමාලාව පැළියගොඩ විද්‍යාලංකාර පිරිවෙනේ සාර්ථක ලෙස පවත්වා ගෙන යනු ලැබේ. | |
| (ii.) සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ මුළු ආදායම රු.71,660,296 ක් වූ අතර අරමුදලේ අරමුණු සඳහා රු.13,393,495 ක වියදමක් එනම් ආදායමින් සියයට 19 ක් පමණක් යොදවා තිබුණි. මෙලෙස වාර්ෂිකව අතිරික්ත වන මුදල් ආයෝජනය කර තිබුණු අතර, 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය අනුව මුළු ආයෝජනය රු.483,124,345 ක් විය. දේශීය හෝ විදේශීය කවර වූ හෝ ප්‍රභවයකින් ලැබෙන මුදල් භාර ගැනීම සහ බුද්ධශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම අරභයා ඉතාමත් යෝග්‍ය යැයි අරමුදල සලකන කාර්ය සඳහා එම මුදල් යෙදවීම අරමුදලේ කාර්යභාරය වුවත්, වාර්ෂිකව අරමුදලට ලැබෙන ආදායමට සරිලන අන්දමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අරමුදල අපොහොසත්වී තිබුණි. | සමාලෝචිත වර්ෂය තුල අපේක්ෂිත ආදායමට සරිලන පරිදි වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබුණද ප්‍රමාණවත් වූ මානව සම්පත් හිඟතාවය නිසා බොහෝ වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. | බුද්ධශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම සඳහා වූ වැඩසටහන් සංවිධානය කර අරමුදල් කාර්යක්ෂම අයුරින් භාවිතා කළ යුතු වීම. |

**(ඇ) කාර්ය මණ්ඩල කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බුද්ධශාසන අරමුදල පනතේ 11 වගන්තිය අනුව සුදුසු නිලධාරීන් හා සේවකයින් බඳවා ගැනීම ද ඔවුන්ගේ පාරිශ්‍රමික බුද්ධශාසන අරමුදලේ ආදායමින් ගෙවීමද කළ හැකි වුවද, සමාලෝචිත වර්ෂයේදී කාර්ය මණ්ඩලය බඳවාගෙන නොතිබුණි. අරමුදලේ කටයුතු සඳහා බුද්ධශාසන අමාත්‍යාංශයේ නිලධාරීන් 04 දෙනෙකු අනුයුක්ත කර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ රු.998,221 ක වැටුප් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | බුද්ධශාසන අමාත්‍යාංශයට පරිබාහිරව නිලධාරීන් බඳවාගෙන ව්‍යාපෘති හා ගිණුම් කටයුතු කිරීමට තරම් ප්‍රාග්ධනයක් අරමුදල සතුව නොමැති අතර වාර්ෂික පොලි ආදායම ක්‍රියාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් වන අතර කාර්ය මණ්ඩලය බඳවා ගෙන වැටුප් ගෙවීමට ආදායම ප්‍රමාණවත් නොමැත. දැනට පාලක මණ්ඩලය සැමවිටම ලබාගන්නා පොළී මුදල් බුද්ධශාසනයේ චිරස්තිථියට යොදාගැනීමට උපදෙස් දී ඇති අතර අරමුදල වැඩිදියුණු වන තෙක් අමාත්‍යාංශයේ සිටින සියළු කාර්ය මණ්ඩලවල සහාය සහ ඔවුන්ගේ වියදම් අමාත්‍යාංශය වැය ශීර්ෂය යටතේ පියවනු ලබයි. නමුත් වැඩ ආවරණ දීමනා සහ පරිපාලන වියදම් බුද්ධශාසන අරමුදල විසින් දරණු ලැබේ. | පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම |

(ඉ) අයවැය ලේඛනමය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 දෙසැම්බර් 22 දිනැති පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය පරිදි අරමුදලේ අරමුණුවලට අනුකූලව අයවැය ලේඛනයක් සකස් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අරමුදලේ 2020 වර්ෂයේ අයවැය වාර්තාව ඉදිරියේදී නිසි පරිදි සකස් කිරීමට නිළධාරීන් දැනුවත් කරන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |